# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, III වසර - 2018

## සාක්ෂි සහ අපරාධ නඩුවිධාන කාර්යපටිපාටික නීතිය

## (පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: 07

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු ලියන්න.

(අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකෙරේ.)

1. "සිරගත කිරීම නොව ඇප දීම, මූලික රීතිය ලෙස සංක්ෂිප්තකර දැක්විය හැකිය." ඇප පනතේ අදාල ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීරණ ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න.

2. "කිසියම් පුද්ගලයෙකුට එරෙහිව චෝදනා කරනු ලබන සෑම වෙනස් වූ වරදක් සඳහාම, වෙන් වෙන් වශයෙන් වූ තනි චෝදනාවක් පැවතිය යුතුවන අතර එවැනි සෑම චෝදනාවක්ම වෙන් වෙන්ව විභාග කල යුතුය", යන්න සාමන්‍ය රීතිය වුවද, අපරාධ නඩු විධාන සංග්‍රහ පනත මෙම සාමාන්‍ය රීතියට සුවිශේෂී ව්‍යතිරේඛ හඳුනාගෙන ඇත.

   අපරාධ විමර්ශනයන් පවත්වාගෙනයාම සම්බන්ධයෙන් අදාල වූ අපරාධ නඩුවිධාන සංග්‍රහ පනතේ ඇති නෛතික ප්‍රතිපාදනවල ආධාරයෙන් මෙකී ප්‍රකාශය සාකච්ඡා කරන්න.

3. (අ) හෝ (ආ) සඳහා පිළිතුරු ලියන්න.

(අ) අපරාධයක් සිදුකලාද යන්න නිශ්චය කිරීම, එම අපරාධ සඳහා වගකිවයුත්තේ කවුරුන්ද යන්න සොයාගැනීම සහ එම අපරාධය සඳහා වගකිවයුත්තන්ට එරෙහිව නඩු පැවරීම සඳහා සාක්ෂි එක්රැස් කිරීම, පොලිස් විමර්ශනවල පරමාර්ථය වේ. කෙසේ වුවද, සාධාරණ නඩු විභාගයක් සහතික කරන්නා වූ ප්‍රතිපාදන සාක්ෂි ආඥා පනත සහ කාර්ය පටිපාටික නීතිය යන දෙකෙහිම දක්නට ලැබේ.

ඉහත සඳහන්කල ව්‍යවස්ථාවන්හි සඳහන්වන අදාල ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීරණ ඇසුරින් අදහස් දක්වන්න.

හෝ

(ආ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදය අහිංසක බවේ පූර්ව නිගමනය නම් න්‍යාය හඳුනාගන්නා අතර අපරාධ කාර්යපටිපාටික නීතිය ක්‍රියාත්මක කිරීමේදී තනි පුද්ගලයකුගේ නිදහස ආරක්ෂා කිරීමට සහ සාධාරණ නඩු විභාගයකට චූදිතයකුට හිමි අයිතිය සහතික කිරීමට ඵලදායී යාන්ත්‍රණයක් දක්වා ඇත.

ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න.

4. මරණාසන්න ප්‍රකාශයක්, සාක්ෂියක් ලෙස ඇතුලත් කරගැනීම සඳහා ශ්‍රී ලංකාවේ අදාල වන කොන්දේසි විවේචනාත්මකව විග්‍රහ කරන්න.

අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීරණ සමග ඔබගේ පිළිතුර ඉදිරිපත් කරන්න.

5. (අ) හෝ (ආ) සඳහා පිළිතරු ලියන්න.

(අ) ඔප්පු කිරීමේ සාධන භාරය කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් ඔප්පු කිරීමට අදාලව සාක්ෂි ආඥාපනතෙහි තිබෙන ප්‍රතිපාදන සහ සාපරාධී වගකීම

පැවරීමට සාමාන්‍ය සහ සුවිශේෂී ව්‍යතිරේඛයන්හි ඔප්පු කිරීමද ඇතුලත්ව අපරාධ නඩුවක ඔප්පු කිරීමේ සාධන භාරයේ ප්‍රමාණය සාකච්ඡා කරන්න.

හෝ

(ආ) පිහියෙන්ඇන සුනිල්ගේ මිනීමැරුම සිදුකිරීමට එරෙහිව නිමල්ට චෝදනා ගොනුකර ඇත. පහත සඳහන් සාක්ෂි මෙහෙය වීමට පැමිණිලි පක්ෂයට හැකිද?

i. නිමල් විසින් ඇතැම් නීති විරෝධී ක්‍රියා සිදුකරන බවට සුනිල් විසින් පොලිසිය වෙත තොරතුරු ලබාදී ඇති බවත් ඒ බව නිමල් දැන සිටි බව;

ii. සිද්ධියට පෙරදින නිමල් පිහියක් මිළදී ගත්බව;

iii. සුනිල් විසින් පොලිසිය වෙත සිදුකරනු ලැබූ ප්‍රකාශයක ප්‍රතිඵලයක් ලෙසට පොලිසිය විසින් පිහියක් සොයාගෙන ඇති බව;

iv. තම නිවස පසුකර යමින් සිටි ඇතැම් පුද්ගලයන් විසින් නිමල්, සුනිල්ට පිහියෙන් ඇන්න බව පවසනු එක් සාක්ෂිකරුවෙකුට ඇසුන බව;

v. නිමල් තමාට පිහියෙන් ඇන්න බව, මියයාමට පෙර සුනිල් විසින් පොලිසියට සැලකර තිබීම.

6. මුවහතඇති කැපෙන ආයුධයකින් කපා දැමීමෙන් සියදෝරිස්ගේ (මරණකරු) මරණය සිදු කිරීමට එරෙහිව මහාධිකරණය ඉදිරියේ පියදාස (චූදිතයා) අධිචෝදනා ලබා සිටියි. පියදාසට එරෙහි නඩු විභාගයේදී සාක්ෂි ආඥා පනතේ ප්‍රතිපාදන යටතේ අනුකූල කරුණු ලෙස පහත දැක්වෙන සාක්ෂි බන්ධයන් මෙහෙයවිය හැකිදැයි යන්න පිළිබඳව පැමිණිලි පාර්ශවය ඔබගෙන් උපදෙස් බලාපොරොත්තු වෙයි.

i. මරණ කරුගේ බිරිඳට අනුව, ඉඩම් ආරවුලක් මත, චූදිතයා හා මරණකරු අතර හිත් අමනාපයක් පැවති අතර මරණකරු විසින් චූදිතයාට එරෙහිව නඩුවක් පවරා තිබේ. සිද්ධියට සති තුනකට පෙර, මරණකරුගේ නිවසේ

මිදුලට පැමිණි චූදිතයා එම නඩුව ඉල්ලා අස්කර නොගන්නේ නම් මරණකරු මරා දමන බවට තර්ජනයකර තිබේ;

ii. සිද්ධිය සිදුවූ දින උදේ තමන්ගේ වෙළඳ සැලට පැමිණි චූදිතයා මුවහත ඇති කැපෙන මන්න පිහියක් ඉල්ලා සිටි අතර එවැනි මන්න පිහියක් මිළදීගත් බව, 'හිතහොඳ ස්ටෝර්ස්' හි හිමිකරු ප්‍රකාශ කරයි. ප්‍රශ්නගත සිද්ධිය සිදුවී ටික වෙලාවකට පසු චූදිතයා විසින් පඳුරක් පිටුපස පිහියක් සඟවනු තමා දුටු බවත් (එම මන්න පිහියෙහි ලේ පැල්ලම් තිබෙනු තමා හොඳින් දුටු බවත්) කිරිහොඳා නැමති සාක්ෂිකරු ප්‍රකාශ කරයි;

iii. සිද්ධියට සතියකට පෙර චූදිතයා තුවක්කුවකින් මරණකරුට වෙඩි තැබූ නමුදු ඉලක්කය වැරදීම නිසා වෙඩි උණ්ඩය නොවැදීමෙන් මරණකරුට හානියක් නොවූ බව කිරිනයිදේ නම් සාක්ෂිකරු ප්‍රකාශ කරයි. සිද්ධිය සිදුවන අවස්ථාව වන විට ගුණපාල නැමැත්තෙකු වෙඩි තබා මරාදැමීමට උත්සාහ කිරීම නිසා මිනීමැරීමට තැත් කිරීම සම්බන්ධයෙන් විසදෙමින් පවතින නඩුවක් චූදිතයාට එරෙහිව තිබෙන බව, සාක්ෂිකරු තවදුරටත් ප්‍රකාශ කරයි;

iv. සිද්ධිය සිදුවූ ස්ථානයේ පොර බැදීමක සලකුණු සහ ලේ පැල්ලම් සලකුණු තිබූ බවට විමර්ශන සිදුකල පොලිස් නිලධාරියා නිරීක්ෂණය කරතිබුනු අතර සිද්ධියට පසු චූදිතයා ගමෙන් පලාගොස් ඇති බවත්, දින තුනකට පසුව කැලයක් තුල සැඟවී සිටියදී චූදිතයාව සිරභාරයට ගත්බවත් පොලිස් නිලධාරියා ප්‍රකාශ කරයි. ගුණපාල නැමැත්තෙකු මරා දැමීමට තැත්කිරීම සම්බන්ධයෙන් චූදියාට එරෙහිව විසදෙමින් පවතින නඩුවක් තිබෙන බව ඔහු තහවුරු කරයි.

(7) චූදිතයකු විසින් සිදුකරනු ලැබූ වරද කියාපෑමක් අපරාධ නඩුවක නඩු විභාගයේදී සාක්ෂියක් ලෙසඇතුලත්කරගත හැකිවන්නේ සාක්ෂි ආඥා පනතේ සඳහන් වන සුරැකිතාවයන් සමග එකඟ වූවහොත් පමණි.

ශ්‍රී ලංකාවේ විනිශ්චිත නඩු තීරණ සහ අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනයන් ඇසුරින් ඉහත සඳහන් ප්‍රකාශයේ වලංගු බව පරික්ෂා කරන්න.

---